# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2025/38 – 2017 ජුනි මස 30 වැනි සිකුරාදා – 2017.06.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

ඒල්. ඩී. බී 21/78 (xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින්, (2015 මාර්තු 31 වැනි දින අංක 1908/23 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය මගින් අවසන් වරට සංශෝධිත) 1995 නොවැම්බර් 7 වැනි දින අංක 896/2 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයට අදාළ එකී පනතේ 21 වන වගන්තිය යටතේ වූ උපලේඛනයේ I වැනි තීරයේ දැක්වෙන "සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය" යන අයිතමයට අනුරූප වන්නා වූ උපලේඛනයේ II වැනි තීරයේ දැක්වෙන "5. භාෂා අධ්‍යයන අංශය" යන සටහනට ඉක්බිතිවම පහත දැක්වෙන සටහන ඇතුළත් කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"6. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශය".

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 ජුනි මස 28 වැනි දින,
කොළඹ දීය.

07-409

1A – PG3589 – 508(2017/06)　ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*